# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය

සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

நிதி அமைச்சு

சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு

Ministry of Finance

State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| මගේ අංකය<br>எனது இல<br>My No | ~~DSD/HO/04/ER/09/200,000~~ | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ............ | දිනය<br>திகதி<br>Date | 2021.02.25 |
|---|---|---|---|---|---|

දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,

ප්‍රාදේශීය ලේකම්,

දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය හා සහකාර අධ්‍යක්ෂ,

සමෘද්ධි මූලස්ථාන , බැංකු සමිති , ව්‍යාපෘති හා බැංකු / කලාප කළමනාකරු,

සමෘද්ධි සංවර්ධන නිලධාරි,

**සෞභාග්‍යා සතිය මාර්තු 2 -8 දක්වා වන සතිය තුල විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

මාර්තු 02 – 08 සතිය රජය විසින් සෞභාග්‍යා සතිය ලෙස නම් කර ඇති අතර මෙම සතිය තුල සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාලව විවිධ ක්‍රියාකාරකම් සිදු කිරීමට උපදෙස් ලබා දී ඇත.

02. පවුල් ලක්ෂ 2 ක් සවිබලගැන්වීම පිළිබඳව ඉදිරි දෙසතිය තුල දී රේඛීය අමාත්‍යාංශ වල ප්‍රාදේශීය නිලධාරීන් සමඟ ප්‍රතිලාභී හමු හා පුහුණු වැඩමුළු පැවැත්වීම සිදුවන බැවින් ග්‍රාමීය කමිටුවේ නිලධාරීන් මේ පිළිබඳව කඩිනමින් දැනුවත් කිරීම කළ යුතු වේ. ඉදිරි සතිය තුල දී බැංකු කලාප මට්ටමින් වසම්භාර සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සහ ගම්මාන වල ප්‍රජා සංවිධාන වල නියෝජිතයින් 2021 වර්ෂයේ ක්‍රියාත්මක ව්‍යාපෘති සම්බන්ධයෙන් දැනුවත් කළ යුතු අතර මෙම කාර්යය මූලස්ථාන / ව්‍යාපෘති / බැංකු සමිති හා කලාප කළමණාකරුවන් මෙන්ම කලාප සහකාර, ව්‍යාපෘති සහකාර හා සමාජ සංවර්ධන සහකාර විසින් සිදු කළ යුතු වේ. මෙම වැඩසටහන් සඳහා ඒ ඒ රේඛීය අමාත්‍යාංශ වලට අයත් ආයතන වල ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන් සහභාගී කරවා ගත යුතු අතර ඉදිරි දෙසතිය තුල දී ප්‍රතිලාභී හමු හා පුහුණු වැඩමුළු පැවැත්වීමට දින යොදා ගැනීම මෙම රැස්වීමේ දී කළ යුතු වේ.ඉහත රැස්වීම COVID – 19 වසංගත රෝග තත්ත්වය හේතුවෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය නිකුත් කර ඇති මාර්ගෝපදේශයන්ට පටහැනි නොවන පරිදි පැවැත්වීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

03.එමෙන්ම ග්‍රාමීය සහ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සමහර ප්‍රදේශ වල දැනටමත් ක්‍රියාත්මක බැවින් කඩිනමින් තෝරා ගනු ලබන ප්‍රතිලාභීන්ගේ තොරතුරු CRM මොඩියුලයට ඇතුලත් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දීම අත්‍යාවශ්‍ය වේ. ඒ සඳහා ආකෘති පත්‍ර අංක 01 හා 02 ඔබ වෙත ලබා දී ඇත. එය සම්පූර්ණ කිරීමේදී යොදාගත යුතු ව්‍යාපෘති නාමයන් සඳහන් ඇමුණුම් කෘෂිකර්ම,සත්ත්ව පාලන, ධීවර,කර්මාන්ත, වෘත්තීය පුහුණු හා අලෙවි ක්ෂේත්‍ර යටතේ වෙන් වෙන්ව දක්වා ඇත.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Batta

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011 |

04.දිවයින පුරා අලෙවි සැල් 25,000 ක් පිහිටුවීමේ වැඩසටහනට අදාලව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව විසින් තෝරා ගනු ලබන තරුණ කාන්තා ව්‍යවසායකයින් සඳහා ඉදිරියේ දී අදියර වශයෙන් නියමු පුහුණු වැඩමුළු පැවැත්වීම තරුණ කටයුතු අමාත්‍යාංශය, කාන්තා කටයුතු අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුළු ආයතන කිහිපයක් සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීමට නියමිතය.

05. ඉහත රැස්වීම් වල දී අප දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක සමාජ සංවර්ධන, නිවාස සංවර්ධන, ආධ්‍යාත්මික සංවර්ධන හා බැංකු කටයුතු පිළිබඳව ග්‍රාමීය මට්ටමින් ප්‍රජා මූල සමිති වල සාමාජිකයින් ඇතුළුව අනෙකුත් ආයතන වල නිලධාරීන් දැනුවත් කිරීම කළ යුතු වේ.

06. සෞභාග්‍යා සතිය තුල සිදු කළ යුතු මෙම වැඩසටහන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය සපයාගැනීම් හා තේ පැන් සංග්‍රහයන් වෙනුවෙන් රු. 5,000.00 ක මුදලක් සෑම ප්‍රජා මූල බැංකු කලාපයක් වෙතම ලබාදෙනු ඇත. ඊට වඩා වැඩි වියදමක් දැරීමට සිදුවන්නේ නම් ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගන්නා ලෙස ද කාරුණිකව දන්වමි.

ආර්.පී.බී.තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :-

1. ලේකම්, ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යය සාධන බලකාය. - කා.දැ.ගැ.පි.
2. ලේකම්, ජාතික සම්බන්ධීකරණ ජීවනෝපාය අනු කමිටුව, ආර්ථික පුණර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධන බලකාය - කා.දැ.ගැ.පි.
3. ලේකම්, සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි හා අ.ක.ස.
5. සියළුම අංශ ප්‍රධානීන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි හා අ.ක.ස.